# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk

මගේ අංකය: DG/CA/AD/144

2026.04.20

සියලූම නම් කල අධිකාරීන් වලට අයත් ආයතන ප්‍රධානීන් වෙත,

**<u>මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියට අදාලව නම් කරන ලද අධිකාරීන් (Designated Authority) සම්බන්ධයෙනි.</u>**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය සම්බන්ධ අංක 01/2026 හා 2026.04.08 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ලබාදුන් ඩෑෂ් බෝර්ඩ් (Dashboard) සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බලයලත් නිලධාරියකු නම් කල අධිකාරියේ ප්‍රධානියා විසින් පත් කර ගත යුතුය. [නම් කල අධිකාරීන් ඇතුලත් නාම ලේඛනය ඉහත සඳහන් චක්‍රලේඛයේ දක්වා ඇත]

03. නම් කල අධිකාරීන් dashboard සඳහා රාජකාරීමය විද්‍යුත් ලිපිනයක් (official e-mail address) නම්කල අධිකාරීන් හි ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය.

04. එසේ ඔබ විසින් ලබාදෙන විද්‍යුත් ලිපිනය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරිශීලක නාමය (user name) සහ මුරපදය (password) ලබාදීමක් සිදුකරනු ඇත.

05. නම් කල අධිකාරියේ ප්‍රධානියාගේ සහ dashboard භාවිතා කිරීම සඳහා පත් කරන ලද බලයලත් නිලධාරියාගේ තොරතුරු ආකෘතිය 1 ප්‍රකාරව දැන්විය යුතු අතර බලයලත් නිලධාරියා විසින් dashboard තුල සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් බලයලත් නිලධාරියාත් අදාල අධිකාරියේ ප්‍රධානියාත් ඍජුවම වගකිව යුතු බව මෙමඟින් දැනුම් දෙමි.
[මෙම ආකෘතියට අදාල තොරතුරු යම් අවස්ථාවක වෙනස් වන්නේ නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය වෙත ප්‍රමාදයකින් තොරව ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.]

06. ආකෘතිය 1 ට අදාල තොරතුරු බලයලත් නිලධාරියා හෝ වෙනත් වගකිව යුතු නිලධාරියකු විසින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කර නො.36, මලලසේකර මාවත, කොළඹ 7 හි පිහිටි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශයට රාජකාරී දිනයන්හි පෙ.ව 8.30 ත් ප.ව 4.00 ත් අතර කාලය තුල **අතින් ගෙනැවිත් භාර දිය** යුතුය.

07. එදිනම, අංක 4 හි සඳහන් තොරතුරු සහ නම් කල අධිකාරිය ලෙස ඔබ යටතට වැටෙන ආයතන වල නාමලේඛනය වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශයේ බලයලත් නිලධාරීන් විසින් ඍජුවම ලබා දීමක් සිදුකරනු ඇත.

08. ඔබ විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශයට **පැමිණීමට පෙර 0767011954** යන අංකය අමතා **දිනයක් සහ වේලාවක් ලබාගැනීමට කටයුතු කිරීමෙන්** ඔබට මුහුණ දීමට සිදුවිය හැකි අපහසුතා මඟහරවා ගත හැකි බව තවදුරටත් සඳහන් කරමි.

09. මේ සඳහා බලයලත් නිලධාරියාගේ පැමිණීම අපේක්ෂා කරමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ආර්.එස්.ඒ.දිසානායක**
අධ්‍යක්ෂ ජනරාල්


වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය

දුරකථන අංක - 0112596359
0767011954

ඊමේල් ලිපිනය - assetsciaboc@gmail.com
ෆැක්ස් අංකය - 0112587287

**ආකෘතිය 1**

| No. | Description | Information |
|---|---|---|
| 01 | Name of the designated authority and Dash Board Number | |
| | | |
| 02 | Name of the head of the designated authority | |
| | Personal Telephone Number | |
| | Official Telephone Number | |
| 03 | Name of the Designated Officer | |
| | Personal Telephone Number | |
| | Official Telephone Number | |
| 04 | Official Email - Address for the dash board | |
| 05 | Address of the designated authority | |